Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත තරග විභාගය - 2019 (2020)

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානයන්හි ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු 706ක් සීමිත තරග විභාගයක් මගින් සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය -2019'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය - 2020.03.06

ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) ලිඛිත විභාගයක, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයෙන් සෑම විෂයයක් සඳහාම සමත් වීමට අවශ්‍ය 40% ක් වූ අවම ලකුණු සංඛ්‍යාව ලැබූවන් හා ඊට ඉහළ ලකුණු ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් සාමාන්‍ය සම්මුඛ

පරීක්ෂණයකට කැඳවනු ඇත. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙහි අදාළ මූලික සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කරගත් අයදුම්කරුවන් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණු සංඛ්‍යාව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ.

*සටහන 01-* ලිඛිත තරග විභාගයේ සෑම විෂයයක් සඳහාම සමත්වීමට අවශ්‍ය 40% අවම ලකුණු හෝ ඉන් ඉහළ ලකුණු ලබා ගැනීම සම්මුඛ පරීක්ෂණයට අනිවාර්යයෙන් කැඳවිය යුතුය යන්න මින් අදහස් නොකෙරේ.

(ආ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. බඳවාගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරා තිබේදැයි මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. මූලික සුදුසුකම් සපුරා නොතිබේ නම් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා යොමු නොකෙරේ.

(ඇ) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය මෙම නිවේදනයේ වගුව 05 හා වගුව 06 යටතේ දක්වා ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය යටතේ වන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී හා ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සේවයට බඳවා ගනු ලැබේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයන් එක් අයකුට වඩා සිටී නම් ඒ පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් ගනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවට බලය ඇත. ලිඛිත විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වෙන අතර අපේක්ෂකයකුට තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට ඉල්ලුම් කළ හැකිය. ලිඛිත විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම බඳවා ගනු ලැබේ. සෑම අයදුම්කරුවකුම අයදුම් කරන විෂයයේ භාෂා මාධ්‍යයෙන් ලිඛිත විභාගයට පෙනී සිට ඉන් සමත්විය යුතු අතර ප්‍රායෝගික පරීක්ෂණය ද එම භාෂා මාධ්‍යයෙන්ම සිදු කළ යුතුවේ. මෙම නිවේදනයේ අංක 04 යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන්ම තිබීම අත්‍යවශ්‍ය නොවේ.

(ඈ) සීමිත තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවන් වගුව 01හි දක්වා ඇත. මෙම පුරප්පාඩු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල පවතින පුරප්පාඩු සඳහා වන අතර මෙම පුරප්පාඩු බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ ලකුණු අනුපිළිවෙළ පදනම් කරගෙන සම්පූර්ණ කරනු ලබයි. පුරප්පාඩු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන වශයෙන් පවත්නා ආකාරය වගුව 02හි දක්වා ඇත. එක් අයදුම්කරුවකුට එකම භාෂා මාධ්‍යයේ පහත පුරප්පාඩු දක්වා ඇති විෂයයන් 03ක් සඳහා ඉල්ලුම් කළ හැකිය. එක් අපේක්ෂකයකු විෂයයන් කිහිපයකට සුදුසුකම් ලැබුවහොත් ඔහු තම අයදුම්පතේ විෂයයන් ඉල්ලුම්කර ඇති අනුපිළිවෙළ අනුව බඳවා ගන්නා විෂයය තීරණය කරනු ලැබේ. එම අයදුම්පතෙහි දක්වා ඇති විෂයය අනුපිළිවෙල අයදුම්කරුට පසුව වෙනස් කළ නොහැක.

වගුව 01 : ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම විෂයයන් හා මාධ්‍ය අනුව 2019.08.06 දිනට පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු අංකය* | *විෂයය* | *සීමිත* | | | |
|---|---|---|---|---|---|
| | | *සිංහල* | *දෙමළ* | *ඉංග්‍රීසි* | *එකතුව* |
| 1 | වෘත්තීය විෂයය | 111 | 47 | 19 | 177 |
| 2 | සිංහල භාෂාව (මව්බස) | 44 | 0 | 0 | 44 |
| 3 | සිංහල භාෂාව (දෙවන බස) | 34 | 0 | 0 | 34 |
| 4 | දෙමළ භාෂාව (මව්බස) | 0 | 17 | 0 | 17 |
| 5 | දෙමළ භාෂාව (දෙවන බස) | 0 | 66 | 0 | 66 |
| 6 | ඉංග්‍රීසි | 0 | 0 | 88 | 88 |
| 7 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 20 | 9 | 1 | 30 |
| 8 | නැටුම් (පෙරදිග) | 12 | 0 | 0 | 12 |

| අනු අංකය | විෂයය | | සීමිත | | | |
|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව |
| 9 | නැටුම් (භරත) | | 0 | 5 | 0 | 5 |
| 10 | සංගීතය (පෙරදිග) | | 10 | 0 | 0 | 10 |
| 11 | සංගීතය (කර්ණාටක) | | 0 | 9 | 0 | 9 |
| 12 | බටහිර සංගීතය | | 0 | 0 | 3 | 3 |
| 13 | චිත්‍ර | | 16 | 8 | 0 | 24 |
| 14 | නාට්‍ය හා රංග කලාව | | 10 | 3 | 0 | 13 |
| 15 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | 6 | 5 | 5 | 16 |
| 16 | ප්‍රාථමික අධ්‍යාපනය | | | | | |
| | 161 | මව් බස | 3 | 4 | 0 | 7 |
| | 162 | සෞන්දර්ය අධ්‍යාපනය හා නිර්මාණාත්මක කුසලතා | 8 | 8 | 0 | 16 |
| | 163 | ශාරීරික අධ්‍යාපනය | 3 | 4 | 0 | 7 |
| | 164 | විශේෂ අධ්‍යාපනය | 1 | 1 | 0 | 2 |
| | 165 | ඉංග්‍රීසි | 0 | 0 | 10 | 10 |
| | 166 | විද්‍යාව | 4 | 1 | 0 | 5 |
| | 167 | ගණිතය | 11 | 5 | 0 | 16 |
| | 168 | පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් | 10 | 5 | 0 | 15 |
| | 169 | ආගම | 4 | 2 | 0 | 6 |
| 17 | බුද්ධ ධර්මය | | 8 | 0 | 0 | 8 |
| 18 | කතෝලික ධර්මය | | 2 | 1 | 0 | 3 |
| 19 | ක්‍රිස්තු ධර්මය | | 2 | 1 | 0 | 3 |
| 20 | හින්දු ධර්මය | | 0 | 3 | 0 | 3 |
| 21 | ඉස්ලාම් ධර්මය | | 0 | 3 | 0 | 3 |
| 22 | ගණිතය | | 2 | 1 | 3 | 6 |
| 23 | ජීව විද්‍යාව | | 2 | 1 | 1 | 4 |
| 24 | රසායන විද්‍යාව | | 1 | 1 | 1 | 3 |
| 25 | භෞතික විද්‍යාව | | 2 | 0 | 1 | 3 |
| 26 | යාන්ත්‍රික තාක්ෂණය | | 0 | 1 | 0 | 1 |
| 27 | ඉදිකිරීම් තාක්ෂණය | | 1 | 0 | 0 | 1 |
| 28 | විදුලි හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය | | 0 | 1 | 0 | 1 |
| 29 | ශිල්ප කලා (මැටි ශිල්පය හා හස්ත කර්මාන්තය) | | 1 | 1 | 0 | 2 |
| 30 | පුරවැසි අධ්‍යාපනය | | 4 | 4 | 1 | 9 |
| 31 | ඉතිහාසය | | 2 | 1 | 0 | 3 |
| 32 | භූගෝල විද්‍යාව | | 1 | 1 | 0 | 2 |
| 33 | කෘෂි විද්‍යාව | | 1 | 1 | 0 | 2 |
| 34 | විශේෂ අධ්‍යාපනය | | 1 | 4 | 0 | 5 |
| 35 | ගෘහ ආර්ථික විද්‍යාව | | 1 | 5 | 0 | 6 |

| *අනු අංකය* | *විෂයය* | *සීමිත* | | | |
|---|---|---|---|---|---|
| | | *සිංහල* | *දෙමළ* | *ඉංග්‍රීසි* | *එකතුව* |
| 36 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | 1 | 1 | 0 | 2 |
| 37 | කළමනාකරණ අධ්‍යයනය | 1 | 3 | 0 | 4 |
| | එකතුව | 340 | 233 | 133 | 706 |

*වගුව 02 :* ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානයන්හි ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ 2019.08.06 වැනි දිනට පුරප්පාඩු පවතින ආකාරය :

| | සීමිත | | | එකතුව |
|---|---|---|---|---|
| ආයතනය | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 139 | 80 | 34 | 253 |
| ගුරු මධ්‍යස්ථානය | 156 | 97 | 64 | 317 |
| ගුරු විද්‍යාලය | 45 | 56 | 35 | 136 |
| | 340 | 233 | 133 | 706 |

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1925/37 සහ 2015.07.28 වැනි දින දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද හා අංක 2141/73 දරන 2019.09.19 වැනි දින හා අංක 2153/06 දරන 2019.12.09 දින කරන ලද සංශෝධන අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලට ද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවන් සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

III. ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර 03ක් ඉකුත් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුශාංගික වන චක්‍රලේඛ අනුව නියමිත අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතා මට්ටම පත්වීමේ දින සිට වසර පහ (05) ක් ඇතුළත ලබා ගත යුතුවේ. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර තුන (03) ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාව ලබා ගත යුතු අතර, සේවයට බඳවා ගනු ලැබූ නිලධාරියකු බඳවා ගැනීමේ දින සිට වසර තුන (03) ක් ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. නිලධාරියකු අ.පො.ස. (සා.පෙ.) විභාග යේදී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමර්ථයකින් සමත්ව ඇතිනම් සන්ධාන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් සේවා ව්‍යවස්ථාවේ උපලේඛන ''VIII'' සඳහන් පරීක්ෂණය සමත් විය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවා ගත් නිලධාරියකු මෙම අවශ්‍යතාවෙන් නිදහස් කෙරේ.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

VI. නේවාසික පහසුකම් සලසා ඇති විට අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හෝ ගුරු මධ්‍යස්ථාන සීමාව තුළ පදිංචි විය යුතුය. නේවාසික පහසුකම් නොමැති විටදී සීමිත දුර ප්‍රමාණයක් තුළ පදිංචි වීමට අවසර දෙනු ලැබේ. එහෙත් විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හෝ ගුරු මධ්‍යස්ථාන සීමාව තුළ නිවාස පහසුකම් සැලසූ විටක එහි පදිංචි විය යුතුය.

VII. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල පවතින පුරප්පාඩු මත බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර බඳවා ගැනීමේ පරීක්ෂණයේ කුසලතාව මත ස්ථානගත කරන ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ හෝ ගුරු විද්‍යාලයේ හෝ ගුරු මධ්‍යස්ථානයේ සේවය කිරීමට එකඟ විය යුතු ය.

03. වැටුප් පරිමාණය:

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-01-2016 හි රු. 47,615- 10 x 1,335 - 8 x 1,630 - 17x 2,170 - රු.110,895/-ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. සුදුසුකම් සහ පළපුරුද්ද:

I. සාමාන්‍ය සුදුසුකම්:

(i) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ තනතුරේ ස්ථිර කර ඇති නිලධරයකු විය යුතුය.
(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ හෝ ඒකාබද්ධ සේවා කාලය තුළ සියලු වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.
(iv) සීමිත තරග විභාගය සඳහා වාර තුන (03) කට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තකුට අවසර නොමැත.
(v) *සුදුසුකම් ලබන දිනය.-* සේවයට පත් කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අංක 04 සිට 06 ඡේදය දක්වා සඳහන් කර ඇති සියලු සුදුසුකම් අයදුම්පත් භාරගැනීමේ අවසාන දින හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේනම් පමණි.

II. අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පහත සඳහන් එක් සුදුසුකමක් ලබා තිබීම;

(i) අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් ලබාගත් පන්ති සාමර්ථ්‍යයක් සහිත මූලික උපාධියක්
(ii) අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් මූලික උපාධියක් සමග එම ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක්
(iii) අදාළ විෂයය ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් ලබාගත් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක්
(iv) අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යාපනවේදී උපාධියක්
(v) අදාළ විෂයය ක්ෂේත්‍රයේ මූලික උපාධිය සමග අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක්

*සටහන 2-* වෘත්තීය විෂයය සඳහා පමණක් ඕනෑම ක්ෂේත්‍රයක මූලික උපාධියක් සමග අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් සලකා බලනු ලබයි.

(iv) අංක 1925/37 දරන 2015.07.28 සේවා ව්‍යවස්ථාවේ උපලේඛන VII හා එයට අංක 2141/73 දරන 2019.09.19 දිනැති හා 2153/06 දරන 2019.12.09 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් කරන ලද සංශෝධන පරිදි සටහන 05හි කොන්දේසිවලට යටත්ව පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් එහි දක්වා ඇති අවම සුදුසුකම් විකල්ප සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

(අ) විශේෂ අධ්‍යාපනය :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විශේෂ අධ්‍යාපන විෂයය සහිත පශ්චාත් උපාධිය සමග පූර්ණ කාලීනව වසර 5ක අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ගුරු පුහුණු සහතිකය සහ අදාළ විෂයය ක්ෂේත්‍රයේ පූර්ණ කාලීනව වසර 6ක ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් හා අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි පූර්ණ කාලීනව වසර 7ක ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(iv) විශේෂ අධ්‍යාපනය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි ගුරු පුහුණු සහතිකය සමග පූර්ණ කාලීනව වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

(ආ) තොරතුරු තාක්ෂණය :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ පරිගණක විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ හෝ උපාධියක් ලබා තිබීම; හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ පරිගණක

විද්‍යාව පිළිබඳ උපාධියක් හා අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම; හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් හෝ සමඟ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම පිළිබඳ වසර 5කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම; හෝ

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම පිළිබඳ වසර 5කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම; හෝ

(v) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක් යටතේ ලබා ගත් උපාධියක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම පිළිබඳ වසර 6ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම; හෝ

(vi) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හා වසර 07කට නොඅඩු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

(ඇ) බටහිර සංගීතය :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳව ලබාගත් උපාධියක් හා වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් සමග අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(iii) බටහිර සංගීතය විෂයය ක්ෂේත්‍රයෙන් ලබා ගත් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා අදාළ පුහුණුවෙන් පසු වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(iv) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද අදාළ විෂයය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් හා වසර 10කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(v) පහත සඳහන් ආයතනයකින් බටහිර සංගීතය viii වන ශ්‍රේණිය ප්‍රායෝගික හා ලිඛිත පරීක්ෂණය සමත්වීම සමඟ වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.

a) Department of Examinations, Sri Lanka
b) Trinity College of Music, London
c) Royal School of Music, London
d) London College of Music
e) Institute of Western Music and Speech, Colombo

(ඈ) ඉංග්‍රීසි :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සහිතව දෙවන භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සමඟ වසර 6ක ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(ii) ඉංග්‍රීසි පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ඉංග්‍රීසි ගුරු පුහුණු සහතිකය සමග ගුරු පුහුණුවෙන් පසු වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.

(ඉ) ශාරීරික අධ්‍යාපනය :

(i) ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හා වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ලබාගත් ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය සමග පුහුණුවෙන් පසු වසර 6කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ධාරාවක උපාධියක් හා පිළිගත් විශ්වවිද්‍යාලයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධිය සමඟ වසර 6ක ශාරීරික අධ්‍යාපනය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම; හෝ

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ධාරාවක උපාධියක් සමඟ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන

විෂයය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ගුරු පුහුණු සහතිකය ලබා වසර 6කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

(ඊ) තාක්ෂණික විෂයයන්

I. ඉදිකිරීම් තාක්ෂණය
II. යාන්ත්‍රික තාක්ෂණය
III. කලා ශිල්ප
IV. විදුලි හා විද්‍යුත් තාක්ෂණය
V. ගෘහ ආර්ථික විද්‍යාව

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ ලබාගත් උපාධියක් හා වසර 07කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(ii) අදාළ විෂයයෙන් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර 07කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හා අදාළ විෂයය පිළිබඳව ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය සමඟ වසර 06කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; හෝ

(iv) අදාළ විෂයය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර 06කට නොඅඩු අදාළ විෂයය ඉගැන්වීමේ පළපුරුද්ද සමග අදාළ විෂයය ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් ඕනෑම සහතිකයක් තිබීම.

a. තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික සහතිකය
b. තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය
c. රජයේ කාර්මික විද්‍යාලයකින් හෝ බහු තාක්ෂණික ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු කාලයක් සඳහා වූ ඩිප්ලෝමා සහතිකය
d. සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් I, II, හෝ III සහතිකය
e. NVQ ''V'' මට්ටමේ තාක්ෂණික සහතිකය

(උ) ප්‍රාථමික අධ්‍යාපන විෂයයන් ඃ

ඕනෑම මූලික උපාධියක් සමඟ අදාළ විෂයය ක්ෂේත්‍රයේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව/ ගුරු පුහුණු සහතිකය සමඟ අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර 07ක ඉගැන්වීමේ පළපුරුද්ද.

*සටහන 3* - අදාළ විෂය ක්ෂේත්‍රය යනු අංක 1925/37 හා 2015.07.28 සේවා ව්‍යවස්ථාවේ හා අංක 2141/73 හා 2019.09.19 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මඟින් කරන ලද සංශෝධනයේ උපලේඛන 02හි සඳහන් ක්ෂේත්‍රයන් වේ.

*සටහන 4* - අයදුම් කරන විෂයය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යවශ්‍ය වන අතර, උපාධිය සඳහා හදාරන ප්‍රධාන විෂයය මුළු විෂය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) අයදුම් කරන විෂයයට අදාළ වන විෂයයක් විය යුතු ය. ඒ බව උපාධිය අයත් විශ්වවිද්‍යාලයීය ලේඛකාධිකාරී මඟින් තහවුරු කර තිබිය යුතු අතර, එම තහවුරු කිරීමේ සහතිකය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ ඉදිරිපත් කළ යුතු ය. මෙයට අමතරව මෙම නිවේදනයේ සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරාලන්නේ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් සහතික මත නම් එම විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් ආයතනයක් බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ලබා ගත් තහවුරු කිරීමේ සහතිකයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. ඉහත තහවුරු කිරීමේ සහතික අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන සහතික භාරගනු නොලැබේ.

*සටහන 5* : සේවා ව්‍යවස්ථාවේ උපලේඛන VII හි දක්වා ඇති මෙම අවම සුදුසුකම් යටතේ බඳවා ගනු ලබන නිලධාරීන් බඳවා ගත් දින සිට වසර 05ක් තුළ තමා බඳවා ගත් විෂයයට අදාළව සේවා ව්‍යවස්ථාවේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරගැනීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වැටුප් වර්ධක ලබාදීම සුදුසුකම් සම්පූර්ණ කරන තෙක් නතර කරනු ලැබේ. එම නිලධාරීන්ගේ II ශ්‍රේණියේ අදාළ උසස්වීම සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා ගනු ලබන අමතර කාලසීමාවට සමාන කාලයකින් ප්‍රමාද කරනු ලැබේ.

III. පළපුරුද්ද ඃ

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට හෝ ඊට පෙර ඉහත මෙම නිවේදනයේ අංක 04 I හා II හි සඳහන් සුදුසුකම් සහිත රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ, හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ, හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ වසර පහ (05) කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ පත්වීම ස්ථිර කර ඇති අයදුම්කරුවකු වීම.

05. වයස් සීමාව :

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

''ඒ අනුව 1975.03.06 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත''

සටහන 6 : මෙම අවස්ථාවේ දී පමණක් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාලවල කාර්ය නියුක්ත පදනමින් සේවය කරන සක්‍රීය හා සතුටුදායක වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අනුයුක්ත කථිකාචාර්යවරුන් සහ ගුරු මධ්‍යස්ථාන කළමනාකරු තනතුරුවල රාජකාරී ආවරණය කරනු ලබන නිලධාරීන්ට උපරිම වයස් සීමාව නොසලකා අයදුම් කිරීමට අවස්ථාව හිමි වේ.

06 : කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

07. අයදුම් කිරීමේ ක්‍රමය :

සේවයට බඳවා ගැනීම සඳහා වගුව 03හි දක්වා ඇති විෂයයන් සඳහා අයදුම්පත් භාර ගනු ලැබේ. එක් අපේක්ෂකයකුට විෂයයන් 3ක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර, තමා අයදුම් කරන විෂයයන් සහ ඊට අදාළ විෂයය අංක අයදුම්පතේ නියමිත ස්ථානයේ නිවැරදිව සඳහන් කිරීම අනිවාර්ය වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය, රජයේ *ගැසට් පත්‍රයේ* දැන්වීම් පළ කිරීම සහ අධ්‍යාපන අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

වගුව 03 :- සේවයට බඳවා ගනු ලබන විෂයයන් හා අදාළ විෂයය අංකයන් :

| *විෂයය ක්ෂේත්‍රය* | *විෂය අංකය* |
|---|---|
| වෘත්තීය විෂයය | 01 |
| සිංහල භාෂාව (මව්බස) | 02 |
| සිංහල භාෂාව (දෙවන බස) | 03 |
| දෙමළ භාෂාව (මව්බස) | 04 |
| දෙමළ භාෂාව (දෙවන බස) | 05 |
| ඉංග්‍රීසි | 06 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 07 |
| නැටුම් (පෙරදිග) | 08 |
| නැටුම් (භරත) | 09 |
| සංගීතය (පෙරදිග) | 10 |
| සංගීතය (කර්ණාටක) | 11 |
| බටහිර සංගීතය | 12 |
| චිත්‍ර | 13 |
| නාට්‍ය හා රංග කලාව | 14 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 15 |
| ප්‍රාථමික අධ්‍යාපනය - මව්බස | 161 |
| ප්‍රාථමික අධ්‍යාපනය - සෞන්දර්ය අධ්‍යාපනය හා නිර්මාණ කුසලතා | 162 |
| ප්‍රාථමික අධ්‍යාපනය - ශාරීරික අධ්‍යාපනය | 163 |
| ප්‍රාථමික අධ්‍යාපනය - විශේෂ අධ්‍යාපනය | 164 |
| ප්‍රාථමික අධ්‍යාපනය - ඉංග්‍රීසි | 165 |
| ප්‍රාථමික අධ්‍යාපනය - විද්‍යාව | 166 |
| ප්‍රාථමික අධ්‍යාපනය - ගණිතය | 167 |
| ප්‍රාථමික අධ්‍යාපනය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | 168 |
| ප්‍රාථමික අධ්‍යාපනය - ආගම | 169 |
| බුද්ධ ධර්මය | 17 |

| විෂයය ක්ෂේත්‍රය | විෂය අංකය |
|---|---|
| කතෝලික ධර්මය | 18 |
| ක්‍රිස්තු ධර්මය | 19 |
| හින්දු ධර්මය | 20 |
| ඉස්ලාම් ධර්මය | 21 |
| ගණිතය | 22 |
| ජීව විද්‍යාව | 23 |
| රසායන විද්‍යාව | 24 |
| භෞතික විද්‍යාව | 25 |
| යාන්ත්‍රික තාක්ෂණය | 26 |
| ඉදිකිරීම් තාක්ෂණය | 27 |
| විදුලි හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය | 28 |
| ශිල්ප කලා (මැටි ශිල්පය සහ හස්ත කර්මාන්තය) | 29 |
| පූරවැසි අධ්‍යාපනය | 30 |
| ඉතිහාසය | 31 |
| භූගෝල විද්‍යාව | 32 |
| කෘෂි විද්‍යාව | 33 |
| විශේෂ අධ්‍යාපනය | 34 |
| ගෘහ ආර්ථික විද්‍යාව | 35 |
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | 36 |
| කළමනාකරණ අධ්‍යයනය | 37 |

08. බඳවා ගැනීම :

8.1 ලිඛිත විභාගය

8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ නගරයේ දී පවත්වනු ලැබේ.

8.1.2 විෂය නිර්දේශය : වගුව 04හි දක්වා ඇති විෂයයන් තුනක් යටතේ මෙම විභාගය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබනුයේ සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම වශයෙන් 40% ක් හෝ ඉන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ලිඛිත විභාගයේ දී දක්වන කුසලතාව අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් පමණි. ලිඛිත තරග විභාගයේ සෑම විෂයයක් සඳහාම සමත්වීමට අවශ්‍ය 40% අවම ලකුණු ලබා ගැනීම සම්මුඛ පරීක්ෂණයට අනිවාර්යයෙන්ම කැඳවීමට සුදුසුකමක් වන බව මින් අදහස් නොකෙරේ.

වගුව 04 : විෂයය නිර්දේශය

| අනු අංකය | විෂයය | විෂයය නිර්දේශය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | අවබෝධය හා අභියෝග්‍යතාව | දෙන ලද මාතෘකාවක්/ තේමාවක් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාසනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කන සහ පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට සහ දී ඇති වගන්ති අනුව තෝරා ගැනීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම, අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක හා රූපකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 2 | 100 | 40 |

| *අනු අංකය* | *විෂයය* | *විෂයය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| 02 | සිද්ධි අධ්‍යයනය | ගුරු අධ්‍යාපනය හා පාසල් අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ ඇතිවිය හැකි සිද්ධි කිහිපයක් ඉදිරියට කර එම සිද්ධිවලට ප්‍රතිචාර දැක්වීම හා ගැටලු නිරාකරණය පිළිබඳ අපේක්ෂකයින්ගේ හැකියාව මැන බැලීම අරමුණු කරගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. | පැය 2 | 100 | 40 |
| 03 | අධ්‍යාපන මූලධර්ම | අධ්‍යාපන දර්ශනය, අධ්‍යාපන සමාජ විද්‍යාව, ගුරු භූමිකාව, අධ්‍යාපන ප්‍රතිපත්ති සහ නූතන ගැටලු, අධ්‍යාපන සැලසුම්කරණ හා කළමනාකරණය, අධ්‍යාපන ඇගයීම, ඉගෙනුම්, ඉගැන්වීම් උපාය මාර්ග, අධ්‍යාපන තාක්ෂණය හා අධ්‍යාපන පර්යේෂණ යන ක්ෂේත්‍රවලට අදාළව අයදුම්කරුගේ අවබෝධය මෙයින් පරීක්ෂා කරනු ලැබේ. | පැය 2 | 100 | 40 |

8.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:

(අ) ලිඛිත විභාගයෙන් එක් එක් විෂයය සඳහා 40% හෝ ඉන් ලකුණු ලබා ගන්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් වූ අයදුම්කරුවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ආ) මෙහි දී ලකුණු ලබාදෙනු නොලැබේ.

(ඇ) උක්ත (අ) පරිදි සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවෙහි තුන්ගුණයකට ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොවුනහොත් එවැනි අවස්ථාවන්හී දී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

8.3 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් සපුරා ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද අයදුම්කරුවන් පමණක් මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(අ) මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා පහත වගුව 05හි සඳහන් නිර්ණායක යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවෙන් අනුමත කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් හා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුව මෙම පරීක්ෂණය සිදු කරනු ලබයි. (මෙම නිවේදනයේ උපලේඛන I හා උපලේඛන II)

වගුව - 05 - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ නිර්ණායකයන්

| ලකුණු ලබා දෙන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් අවම ලකුණු |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 2. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 3. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාවය | 15 | |
| මුළු ලකුණු | 50 | |

8.4 ප්‍රායෝගික පරීක්ෂණය

(අ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් මෙය සිදු කරනු ලබයි.

වගුව - 06 - ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු ලබන නිර්ණායකයන්

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. පාඩම් සටහන් පිළියෙල කිරීම | 20 | 20 |
| 2. ඉදිරිපත් කිරීම | 30 | |
| 2.1 පිවිසුම | 04 | |
| 2.2 පාඩම් සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම | 04 | |
| 2.3 ඉදිරිපත් කිරීමේ විලාසය | 08 | |
| 2.4 විෂයය අන්තර්ගතය | 10 | |
| 2.5 කාල කළමණාකරණය | 04 | |
| එකතුව | 50 | |

සටහන 8 - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට හා ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොලැබුව ද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

09. විභාග කොන්දේසි :

(i) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් තමන් ඉල්ලුම් කරන විෂයයේ භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටිය යුතුය. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දක්වෙන විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 1200 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම්දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන - ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(vi) ඉල්ලුම් පත්‍රය A4 ප්‍රමාණයේ කඩදසිවල දෙපැත්ත භාවිතා කරමින් සකස් කළ යුතු අතර, 01 සිට 04 තෙක් ශීර්ෂ පළමුවැනි පිටුවට ද, 05 සිට ඉදිරියට ශීර්ෂ දෙවැනි, තුන්වැනි හා හතරවැනි පිටුවලටද වන ලෙස සකස් කළ යුතුය. අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත් එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. විභාගයට ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකුම තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු ලවා සහතික කරවා ගත යුතු බවද, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

(vii) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස්සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, ඉල්ලුම් කරන විෂයය හා සංකේත අංකය, අයදුම්කරුගේ අත්සන, විදුහල්පතිගේ සහතිකය හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති

අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් පුවත්පත් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත් පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

(ix) විභාගය පැවැත්වීමට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) අපේක්ෂකයාගේ අනන්‍යතාවය - විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ. :

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බල පත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

*සැ. යු.* - (අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(xi) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කෙරේ. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කෙරෙනු ඇත.

(xii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාග යට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගැනීම අනිවාර්ය වේ.

10. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම

ලිඛිත පරීක්ෂණයෙහි සුදුසුකම් ලැබූ අයගේ ලේඛනය *ගැසට්* නිවේදනයේ 8.1.2 ඡේදය අනුව ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත ලබාදෙනු ඇත. විභාග යට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.exam.result.gov.lk වෙබ් අඩවියේ පළ කිරීම සිදු කරනු ලබන්නේ පත්වීම් ලබාදීමේ කටයුතු අවසන් වූ පසුවය.

11. මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

එන්. එච්. එම්. චිත්‍රානන්ද,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2020 ජනවාරි 27 වැනි දින.

## උපලේඛනය I

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට සීමිත බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය ලකුණු පරිපාටිය
(දෙවන බස සිංහල සහ දෙවන බස දෙමළ හැර අනෙකුත් විෂයයන් සඳහා)
I කොටස - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - උපරිම ලකුණු 50

සැ. යු.:- *ගැසට්* නිවේදනයේ 04 ඡේදයෙහි සඳහන් සුදුසුකම්වලට අමතරව ලබා ඇති සහතික සඳහා ඉහළම සුදුසුකමට ලකුණු ලබා දෙනු ලබන අතර අතිරේක එක් සහතිකයක් සලකා බලනු ලබන්නේ එක් නිර්ණායකයක් සඳහා පමණි.

| | | | |
|---|---|---|---|
| 01. | | අධ්‍යාපන සුදුසුකම් | උපරිම ලකුණු 20 |
| * | 1.1 | පශ්චාත් උපාධිය (අධ්‍යාපන හෝ අදාළ විෂයය පිළිබඳ) | 20 |
| * | 1.2 | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 10 |
| 02. | | ඉංග්‍රීසි භාෂා නිපුණතාවය | උපරිම ලකුණු 15 |
| * | 2.1 | උපාධියට ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත්වීම (බඳවා ගැනීමේ නිවේදනයේ සටහන 4 අදාළ වේ) | 15 |
| * | 2.2 | අ.පො.ස. (උ. පෙළ) ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත්වීම | 10 |
| * | 2.3 | ඩිප්ලෝමා සහතිකය (වසරකට නොඅඩු) | 08 |
| * | 2.4 | සහතික පත්‍ර පාඨමාලා සහතිකය (මාස 06 කට නොඅඩු) | 04 |
| * | 2.5 | අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සඳහා විශිෂ්ට/අධි සම්මාන/ සම්මාන සාමාර්ථය | 03 |
| * | 2.6 | අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා විශිෂ්ට/අධි සම්මාන/සම්මාන සාමාර්ථය | 02 |
| 03. | | තොරතුරු තාක්ෂණ දැනුම | උපරිම ලකුණු 15 |
| * | 3.1 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය | 15 |
| * | 3.2 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධිය | - 12 |
| * | 3.3 | උපාධිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස සමත් වීම (බඳවා ගැනීමේ නිවේදනයේ සටහන 4 අදාළ වේ) | 10 |
| * | 3.4 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය (වසරකට නොඅඩු) | 08 |
| * | 3.5 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා සහතිකය (මාස 06 ට නොඅඩු) | 06 |
| * | 3.6 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මාස 03 කට නොඅඩු මාස 06 කට නොවැඩි සහතික පත්‍ර පාඨමාලා සහතිකය | 04 |

සටහන 1 : 2.3, 2.4, 3.4, 3.5, 3.6 සඳහා අදාළ සහතිකවල කාලය සඳහන් නොවේ නම් සහතික නිකුත් කළ ආයතනය මගින් කාලය සනාථ කරන ලද ලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

සටහන 2 * 1.1, 1.2, 2.1, 2.3, 2.4, 3.1, 3.2, 3.3 සඳහා අදළ සහතිකය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික විය යුතුය.

මුළු ලකුණු 50

II කොටස - ප්‍රායෝගික පරීක්ෂණය - උපරිම ලකුණු 50

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. පාඩම් සටහන් පිළියෙල කිරීම | 20 | |
| 2. ඉදිරිපත් කිරීම | 30 | |
| 2.1 පිවිසුම | 04 | |
| 2.2 පාඩම් සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම | 04 | 20 |
| 2.3 ඉදිරිපත් කිරීමේ විලාශය | 08 | |
| 2.4 විෂයය අන්තර්ගතය | 10 | |
| 2.5 කාල කළමණාකරණය | 04 | |
| එකතුව | 50 | |

## උපලේඛන II

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට සීමිත බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය ලකුණු පරිපාටිය
### (දෙවන බස සිංහල සහ දෙවන බස දෙමළ විෂයයන් සඳහා)
### I කොටස - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - උපරිම ලකුණු 50

*සැ. යු. - ගැසට් නිවේදනයේ* 4 ඡේදයෙහි සඳහන් සුදුසුකම්වලට අමතරව ලබා ඇති සහතික සඳහා ඉහළම සුදුසුකමට ලකුණු ලබා දෙනු ලබන අතර අතිරේක එක් සහතිකයක් සලකා බලනු ලබන්නේ එක් නිර්ණායකයක් සඳහා පමණි.

| | | | |
|---|---|---|---|
| 01. | | අධ්‍යාපන සුදුසුකම් : | උපරිම ලකුණු 20 |
| | * | 1.1 පශ්චාත් උපාධිය<br>(අධ්‍යාපන හෝ අදාළ විෂයය පිළිබඳ) | 20 |
| | * | 1.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 10 |
| | * | 1.3 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල/දෙමළ II මට්ටම සමත් හෝ අ.පො.ස. (සා. පෙළ,) දෙවන බස සිංහල/දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාචික පරීක්ෂණය සමත්වීම.<br>(මේ යටතේ දෙවන බස සිංහල විෂයය සඳහා දෙමළ භාෂා සහතික ද දෙවන බස දෙමළ විෂයය සඳහා සිංහල භාෂා සහතික ද සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.) | 05 |
| 02. | | ඉංග්‍රීසි භාෂා නිපුණතාව | උපරිම ලකුණු 15 |
| | * | 2.1 උපාධියට ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත්වීම<br>(බඳවා ගැනීමේ නිවේදනයේ සටහන 4 අදාළ වේ) | 15 |
| | * | 2.2 අ.පො.ස. (උ. පෙළ) ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත්වීම | 10 |
| | * | 2.3 ඩිප්ලෝමා සහතිකය (වසරකට නොඅඩු) | 08 |
| | * | 2.4 සහතික පත්‍ර පාඨමාලා සහතිකය (මාස 06 කට නොඅඩු) | 04 |
| | * | 2.5 අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සඳහා විශිෂ්ට/අධි සම්මාන/ සම්මාන සාමාර්ථය | 03 |
| | * | 2.6 අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා විශිෂ්ට/අධි සම්මාන/සම්මාන සාමාර්ථය | 02 |
| 03. | | තොරතුරු තාක්ෂණ දැනුම | උපරිම ලකුණු 15 |
| | * | 3.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය | 15 |
| | * | 3.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා උපාධිය | 12 |
| | * | 3.3 උපාධිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස සමත් වීම<br>(බඳවා ගැනීමේ නිවේදනයේ සටහන 4 අදාළ වේ) | 10 |
| | * | 3.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය<br>(වසරකට නොඅඩු) | 08 |
| | * | 3.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා සහතිකය<br>(මාස 06 ට නොඅඩු) | 06 |
| | * | 3.6 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මාස 03 කට නොඅඩු මාස 06 කට නොවැඩි සහතික පත්‍ර පාඨමාලා සහතිකය | 04 |

***සටහන*** : - 1 - 2. 3, 2.4, 3.4, 3.5, 3.6 සඳහා අදාළ සහතිකවල කාලය සඳහන් නොවේ නම් සහතික නිකුත් කළ ආයතනය මඟින් කාලය සනාථ කරන ලද ලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

***සටහන*** : 2 -* 1.1, 1.2, 2.1, 2.3, 2.4, 3.1, 3.2, 3.3 සඳහා අදාළ සහතික, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික විය යුතුය.

මුළු ලකුණු 50

II කොටස - ප්‍රායෝගික පරීක්ෂණය - උපරිම ලකුණු 50

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. පාඩම් සටහන් පිළියෙල කිරීම | 20 | 20 |
| 2. ඉදිරිපත් කිරීම | 30 | |
| 2.1 පිවිසුම | 04 | |
| 2.2 පාඩම් සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම | 04 | |
| 2.3 ඉදිරිපත් කිරීමේ විලාසය | 08 | |
| 2.4 විෂයය අන්තර්ගතය | 10 | |
| 2.5 කාල | 04 | |
| කළමණාකරණය | | |
| එකතුව | 50 | |

**ආදර්ශ අයදුම්පත**

|  |
|---|
|  |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)
(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත පිටපත් දෙකකින් ඉදිරිපත් කරන්න)
Limited Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Teacher Educator's Service -2019(2020)

විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐
සිංහල - 2
දෙමළ - 3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ඉංග්‍රීසි - 4

ඉල්ලුම් කරන විෂයය හා විෂය අංකය තමාගේ මනාපය පරිදි පහත දැක්වෙන වගුවේ සඳහන් කරන්න. (*ගැසට් නිවේදනයෙහි* අංක 07 ඡේදයට අදළව)

| *මනාප අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDENA, H. M. S. K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
2.2 (i) රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ii) රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iii) අදාළ කලාපය :————.
2.3 රාජකාරි දුරකතන අංකය (තිබේනම්) :————.

2.4 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.5 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

2.6 ජංගම දුරකතන අංකය :

3.0 ජාතික හැඳුනුම්පත් අංකය :

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

5.0 5.1 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

5.2 2020.03.06 දිනට වයස :

අවුරුදු : මාස : දින :

6.0 අධ්‍යාපන සුදුසුකම් :

| අනු. අංකය | ඉල්ලුම් කරනු ලබන විෂය අංකය සහ විෂය | බඳවා ගැනීමේ නිවේදනයේ අනු. අංක 04 (II) අනුව සුදුසුකම් ලබන කාණ්ඩය | *සුදුසුකම් පිළිබඳ විස්තර* | | | |
|---|---|---|---|---|---|---|
| | | | මූලික උපාධිය/ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව/පශ්චාත් උපාධිය/වෙනත් සුදුසුකම් (නම) සහ නිකුත් කළ ආයතනය | වලංගු දිනය | පන්තිය/ සාමාර්ථය | ප්‍රධාන විෂයයන් (බඳවා ගැනීමේ නිවේදනයේ සටහන් 04 අනුව සනාථ කළ යුතුය) |
| 01 | | | | | | |
| 02 | | | | | | |
| 03 | | | | | | |

7.0

| *පෙර සේවාවන්* | *සේවයට පත්වූ දිනය හා සේවය ස්ථිර කළ දිනය* | *වර්තමාන සේවය හා සේවයට පත් වූ දිනය* | *වර්තමාන සේවය ස්ථිර කළ දිනය* |
|---|---|---|---|
| උදා : ගුරු සේවය | උදා : 1990.01.01 | උදා : විදුහල්පති සේවය | උදා : 2005.01.01 |
| | | | |

8.0 ගුරු සේවයේ සේවය කරයි නම්/සේවය කළේ නම් :

| පත්වීම් දිනය | පත්වීම් ලැබූ විෂයය | ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව | | | ගුරු පුහුණු සහතිකය | |
|---|---|---|---|---|---|---|
| | | වලංගු දිනය | ක්ෂේත්‍රය | විද්‍යාපීඨය | වලංගු දිනය | ගුරු විදුහල |
| | | | | | | |
| | | | | | | |

9.0 ඔබ රජයේ සේවයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගය සමත් වූ භාෂා මාධ්‍ය සඳහන් කරන්න. :————.

10.0 විභාග ගාස්තු :

විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

11.0 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................. හා ............... දින දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්ව අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුවද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානි/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ආයතන ප්‍රධානි

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ......... ....... ......... හිමි/මහතා/මහත්මිය/මෙනවිය මගේ විද්‍යාලයේ/ආයතනයේ සේවය කරන නිලධාරියකු බව මෙයින් සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන . . . ......... ......... . . හිමි/මහතා/මහත්මිය/මෙනවිය මගේ කලාපයේ . . ............. . සේවය කරන නිලධාරියකු බවත්, අංක 01 සිට අංක 10 දක්වා වූ ඡේදවල සඳහන් කරන ලද විස්තර කාර්යාලයේ ඇති ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :————.